ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
All Rights Reserved

48015

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "ගහන බැවින් තමා අතුරට වන්නවුන් නො පෙනෙන පරිද්දෙන් පය බිම ගැවිය නො දී උර පිටින් ගෙන යන්නී ය."

(අ) මෙසේ කීවේ කවරෙකු විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය රචනා වූ සාහිත්‍ය යුගය නම් කරන්න.

(ii) "අප නො හඳහා නම් තෙපි මැ පිරික්සා බලව"

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?

(ආ) මෙහි 'තෙපි' යනු කවරෙක් ද?

(iii) දෙදහස් පන්සිය වසරක් තිස්සේ - මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදි කර දී මිස - යා නොහැකි ය මට පුංචි පුතුන්

(අ) මෙම පැදි පෙළේ රචකයා නම් කරන්න. මහගම සේකර

(ආ) ඔහු විසින් රචිත චිත්‍රපටයට නැගුණු නවකතාව කුමක් ද?

(iv) "නොගොසින් සිට සිටි වන නිබඳේයා
වෙසෙසින් සුර නර සෙන් නො මඳේයා
..................................................................
මෙලෙසින් වෙණ නද අසන සඳේයා

(අ) කවියේ හිස් තැන සම්පූර්ණ කරන්න.

(ආ) මෙම පද්‍යය උපුටා ගත් මුල් කෘතියේ නම ලියන්න.

(v) "එහෙම දිෂ්ටිය හෙළපු කෑම කාපුවහම තමයි ලෙඩ වෙන්නේ"

(අ) මෙය ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන් ද?

(ආ) මෙම කෙටිකතාවේ රචකයා ලැබූ විශේෂිත සම්මානය කුමක් ද? ෆ නාබෙල්

(vi) පහත දැක්වෙන කෘතිවල රචකයින් නම් කරන්න.

(අ) ගංගා ගීතය (ආ) කව් ලකුණු මිණිමල

(vii) (අ) ජාතික වීර කාව්‍යයක් බවට පත් වී ඇති කාව්‍ය පන්තිය කුමක් ද?, කුශාගීතය

(ආ) ධම්මපද නම් ගාථා සංග්‍රහයට ලියන ලද පාලි අටුවා ග්‍රන්ථය නම් කරන්න.

(viii) "මේ ටවුන්වල මිනිසුන්ට ඕකෙ ගාණක් නෑ"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?



EXAMRESULTS.LK

(ix) "නොදනිති හසරක් නුපුරුදු ඒ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද"

(අ) "ඒ තිදෙන" යනු කවුරුන් ද?

(ආ) මෙම කොටස උපුටා ගත් මුල් කෘතියේ නම ලියන්න.

(x) (අ) සම්භාව්‍ය සාහිත්‍ය ගණයට අයත්, අවසාන පූරක ලෙස සැලකෙන කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(ආ) දියමන්ති මාලය සිංහලයට පරිවර්තනය කළේ කවුරුන් විසින් ද?

(ලකුණු 02 x 10 = 20)

2. පහත දැක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "සෛන්ධවයන් යොදන ලද, සර්වාලංකාරයෙන් සැරසී පිටැ බඳින ලද හියොවුරු ඇති වැ නැඟෙන ලද ධනුර්ධරයන් විසින් **උපලක්ෂිත** වූ සේනා නමැති සමුද්‍රයෙන් නැංගා වූ මහ තල්මස් කැල සේ..."

(අ) මේ අයුරින් දැක්වූයේ කිනම් අංගයක් ද?

(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

(ii) "තව දුරටත් මෙය කල් දැමිය නොහැකි ය. අඩක් වැඩ අවසන් කර ඇති නිසා එසේ කල් දැමීමේ තේරුමක් ද නැත. තඩු, උසාවි යනු බොහෝ ගැමියන්ට මෙන් ම තාත්තාට ද රෞරව නරකය වැනි භයානක දේවල් ය."

(අ) මෙහි කල් දැමිය නො හැකි කාර්යය කුමක් ද?

(ආ) ගැමියන්ට මෙන්.ම තාත්තාට ද රෞරව නරකය වැනි වූ භයානක දේවල් මොනවා ද?

(iii) ම ග නි ල මි න් සිටි නා දොඹ නී පියල
පි ය ස ල මි න් මලගෙහි කෙළැ රොනින' වල
ත තු ඩ ල මි න් බිඳු විලිකුන් මියුරු පල
ඉ සි ඹු ල මි න් යෙහි සැළ දඹ පඳුරුවල

(අ) මෙහි සඳහන් නී, පියල යන ගස් වර්ග හඳුන්වන්න.

(ආ) සිවුවන පදයේ අර්ථය ලියන්න.

(iv) "මා ගිය කලැ ඔහුට සෙත් වෙයි. ගම් නැති තැනැ මහ වල්හි සිටියෙ සිවුපදගයක් අසා මා කෙරෙහි පැව්ජි වැ රාත් වෙයි. ඉදින් නොගියෙම් නම් මව මරා සසරින් නො නැඟිය හැකි වෙයි."

(අ) මෙහි මා, ඔහු යනු කවුරුන් දැයි ලියා දක්වන්න.

(ආ) ගියහොත් ලැබෙන යහපත හා නො ගියහොත් ලැබෙන අයහපත ලියන්න.

(v) හිරිමල් සිනා රළි පෙණ පිඬු මිහිරිතම
ගල්පරවල ම හැපි හැපි බිහි කරමි මම
සම තැනිතලාවල හමුවෙයි අලසකම
නිරසයි අතරමග අවහිර නුදුටු බිම

(අ) මෙම පද්‍යයෙන් ඉදිරිපත් කරන ජීවන දර්ශනය පැහැදිලි කරන්න.

(ආ) පද්‍යයේ අර්ථය කෙටියෙන් ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 4X5 = 20 යි.)

(i) මුල දී හැඟීම්වලට වහල් වීමත්
(ii) පසුව අභියෝග ජය ගැනීමත්

උග්ගසේන සිටු පුත්‍රයාගේ චරිතයෙන් ඉදිරිපත් කිරීමේ දී කතුවරයා අපූරු කතා රසයක් ඉස්මතු කර දක්වන ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

හංස සන්දේශයේ එන කැරගල වැනුමෙන්,

(i) ගමේ පැවති සශ්‍රීක බවත්
(ii) ගැමියන්ගේ ආගමික හැදියාවත්

ඉස්මතු වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 15)

4. (i) ගුණ දහමින් පෝෂිත ජීවිතයත්
(ii) දේශාභිමානී හැඟීමත්

දරුවන්ගේ අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

(i) වියෝ දුක දරා ගත නොහැකි වීම
(ii) සෙනෙහස නිසා ළබැඳියන් සොයා යාම

යන හේතූන් නිසා සිංහයාගේ චරිතය ප්‍රේක්ෂක අනුකම්පාවට බඳුන් වන ලෙස ඉදිරිපත් කිරීමට නිර්මාණකරු ගත් උත්සාහය සාර්ථක වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

5. ඉතා සංයමයෙන් යුතුව අවවාද අනුශාසනා දීමට ජනකවියා ගත් උත්සාහය හානා හිය පානා අඬහැරෙන් දූනේ පද්‍ය පන්තියෙන් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

6. 'සජීවී ලෙස චරිත නිරූපණය කිරීමට ගත් උත්සාහය නිසා දියමන්ති මාලය කෙටිකතාව රසවත් නිර්මාණයක් ලෙස අගය කළ හැකි ය.' උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

7. මතු පරපුරේ අනාගතය අතීත ශ්‍රී විභූතිය ඔස්සේ ගොඩනැඟිය යුතු බව දැනේ කරගැට සිඹ සනසන්නට පද්‍ය පන්තියෙන් ඉදිරිපත් වන ආකාරය උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II, III |

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1. 2 | 11. 1 | 21. 3 | 31. 1 |
| 2. 3 | 12. 3 | 22. 2 | 32. 4 |
| 3. 1 | 13. 4 | 23. 3 | 33. 2 |
| 4. 4 | 14. 2 | 24. 1 | 34. 3 |
| 5. 3 | 15. 3 | 25. 3 | 35. 1 |
| 6. 4 | 16. 3 | 26. 2 | 36. 2 |
| 7. 1 | 17. 1 | 27. 3 | 37. 3 |
| 8. 3 | 18. 2 | 28. 2 | 38. 2 |
| 9. 3 | 19. 3 | 29. 4 | 39. 1 |
| 10. 1 | 20. 1 | 30. 4 | 40. 3 |

(ල . 1 x 40 =40)

## II කොටස

01. (i) (අ) ය් + අ+ ත් + උ+ ර් + අ
(ආ) සෘ + ජ්+ උ
(සියලුම ස්වර හා ව්‍යඤ්ජන අකුරු නිවැරදි පිළිවෙළට ම තිබිය යුතුයි)
(ii) බුදු + සරණ (ආ) පුන + උත්පත්තිය
(iii) (අ) හේතු වූ / මුල් වූ කාරණය
(ආ) තැන්පත් කළ වස්තුව
ඉහත අර්ථ සඳහන් වන උක්තාඛ්‍යාත පද නිවැරදි වාක්‍ය සඳහා ලකුණු පිරිනමන්න.
(iv) (අ) කැලණි (ආ) ලේඛනාගාරය
(v) (අ) සියලු රටවැසියන් බුද්ධිමත් වීම මැනවි.
(ආ) සාකච්ඡා මණ්ඩපයේ කාන්තාවෝ ද ඇත.
(vi) (අ) අවිධිමත් (ආ) නිතරග
(vii) වැසිජලය, අනුබල
(viii) (අ) මම පොතපත පරිශීලනය කරමි/ කරන්නෙමි.
(ආ) කම්වු නියෝජිතයෝ සාමාජිකයන් අගය කළහ./ කළෝය.
(ix) පැමිණෙත්ම - කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / අසම්භාව්‍ය ක්‍රියා
නැගිට - පූර්වක්‍රියා
(x) (අ) වාචාලයා (ආ) අදූරදර්ශී (ලකුණු 02 x 10 = 20යි )

02. රචනාව ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.
01. සාරවත්භාවය මාතෘකාවද ඇතුළු ව ලකුණු 08 යි.
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12 යි.
03. ශිල්පීය දක්ෂතා සහ ජේද බෙදා ලිවීම ලකුණු 05 යි.

03. **සාරාංශකරණය**

මුළු ලකුණු ප්‍රමාණය 10 යි.

ලකුණු විග්‍රහය

01. අන්තර්ගතය — ලකුණු 06 යි.
02. වචන ගණන — ලකුණු 02 යි.
03. ශිල්පීය දක්‍ෂතා — ලකුණු 02 යි.

- වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.
- වචන ගණන 60 අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
- ඡේද බෙදා තිබුණහොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
- එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු 02 කි.
- වචන ගණන 80 ට වැඩි කල්හි හෝ 60 අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
- දුර්වල සාරාංශ සඳහා බිංදුව නොදී ලකුණු 03 ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

**අන්තර්ගතය**

(1) විද්‍යා ප්‍රබන්ධ ප්‍රමුඛ සාහිත්‍යාංගයක් වන අතර අද එය ලොව පුරා ප්‍රසිද්ධත්වයක් උසුලයි.
(2) ලොව ඉහළ ආදායම් ලැබීමටත් ජනප්‍රියත්වයේ හිණිපෙත්තට නැගීමටත් මේවාට හැකි වී තිබේ.
(3) ශ්‍රී ලංකාවේ මෙයට හිමි ව ඇත්තේ අඩු සැලකිල්ලකි.
(4) ලාංකීය නිර්මාණ සාම්ප්‍රදායික රාමුවලට කොටුවීමට උත්සාහ දරයි.
(5) නමුත් ඒවා ගුණාත්මක බවින් ඉහළ මට්ටමක නොතිබීම ද දක්නට ලැබේ.
(6) එබැවින් ලාංකීය විද්‍යා ප්‍රබන්ධ නිර්මාණය සඳහා ඇති ගැටලුවලට විසඳුම් සොයා විවිධ උපක්‍රම ඇසුරෙන් මේ සාහිත්‍යාංගය දියුණු මට්ටමකට ගෙන ඒමට නිර්මාණ කරුවන් සමත් විය යුතුයි.

04 අවබෝධය ඡේදය

(i) වසර බිලියන තුනකටත් වඩා ඈත අතීතයේ දී
(ii) ටයිටේනියම් ලෝහය
(iii) • ක්‍රීඩා උපකරණ සාදාගැනීම
  • ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ දී ගෙවී ගිය මිනිස් අස්ථි කොටස් වෙනුවට කෘත්‍රිම සන්ධි සැකසීම.
(iv) පුල්මුඩේ
(v) ඉල්මනයිට් රූටයිල් හා සර්කෝන් වැනි පාෂාණ එලෙස ම හාරා රට පැටවීම

(ලකුණු 02 x 05 = 10යි )

**අත්පත්‍රිකාව**

ලකුණු විග්‍රහය

| | |
|---|---|
| ආකෘතිය | ලකුණු 04 යි. |
| අන්තර්ගතය | ලකුණු 08 යි. |
| ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |
| මුළු ලකුණු | 15 යි. |

**පුවත්පත් වාර්තාව**

ලකුණු විග්‍රහය

| | |
|---|---|
| ආකෘතිය | ලකුණු 04 යි. |
| අන්තර්ගතය | ලකුණු 08 යි. |
| ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |
| මුළු ලකුණු | 15 යි. |

## III පත්‍රය

01. (i) (අ) වෛදේහ රජ (ආ) කුරුණෑගල යුගය (14 සියවස)

(ii) (අ) තුන් රැස ම - දිසාපාමොක් ආචාරින්ගේ ශිෂ්‍ය පිරිස

(ආ) මෙහි 'තෙපි' යනු දිසාපාමොක් ආචාර්යවරයා ය.

(iii) (අ) මහගම සේකර (ආ) තුංමං හංදිය

(iv) (අ) සතොසින් විද විද ලොබ නා සිදේයා (ආ) ගුත්තිල කාව්‍ය

(v) (අ) මම - කථිකයා - අයියා (ආ) සාහිත්‍ය රත්න සම්මානය (ජීවිතයේ එක් වරක් පමණක් ලැබෙන)

(vi) (අ) රත්න ශ්‍රී විජේසිංහ (ආ) වීදාගම මෛත්‍රිය හිමි

(vii) (අ) දරු නැලවිල්ල හෙවත් ජාතික තොටිල්ල (ආ) ධම්මපාදථය කථාව

(viii) (අ) මහලු සීයා/මහල්ලා (ආ) බද්දේගම

(ix) (අ) සුප්පා දේවිය, සිංහබාහු, සිංහ සීවලී (ආ) සිංහ බාහු

(x) (අ) කුස ජාතක කාව්‍ය (ආ) කේ.ජී. කරුණාතිලක

02. (i) (අ) අටලොස් අක්ෂෞහිණියක් වූ සේනාවේ රථ වළල්ල / රිය පෙළ

(ආ) හී කොපු / අලංකාර වූ

(ii) (අ) වැසිකිළියේ වැඩ අවසන් කිරීම

(ආ) නඩු යාම, උසාවි යාම

(iii) (අ) බත්, මී /මොර (ආ) ජම්බු පඳුරුවල හිඳ විවේක ගෙන යන්න.

(iv) (අ) බුදුන් වහන්සේ /ඇහැල මල් සාරු

(ආ) පැමිණීම රාත් වීම/ මව මරා සසරින් නොනැගිය හැකි වීම.

(v) (අ) අභියෝග නොමැති ජීවිතය ඒකාකාරී නීරස එකක් බව

(ආ) ගඟක් බාධන හමුවේ විසිතුරුව, සුන්දරව පවතියි. එසේම ජීවිතය ද බාධක අභියස සිත්කලු වන ආකාරය දක්වේ.

03. 3, 4 ප්‍රශ්න සඳහා උදාහරණ සඳහා ලකුණු 4 ක් ද ඒවා පිළිතුරට ගැළපීම සඳහා ලකුණු 1 ක් ද පිරිනැමේ.

03. (i)
- ඇස සිට නටන ඒ විද්දත් දුවගේ .................. ලීලා දක වයෝධාත්මික රූප කලාප විකාරයක් බලවත් නිසා යැයි නොසිතා .......
- ලදොත් ජීවත් වෙමි නොලදොත් මියමි'' සිතාගෙන නොකා නොබී පහළට නැගිලා වැද නොගත්හ.
- එසේ වී නම් මම උන් හා එක් වෙමි,යි කියලා නෑයන් සීයන් නොඑක් ලෙසින් නැවතුවත්...

(ii)
- .''.............කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම්දැයි කියලා.....''
- '' ඇගේ ඒ බැමුම් පලවා මමත් ශිල්ප උගනිමි''
- .''.............ඇඟිලි පෑ එහි කොටලා නික්ම හිස් අහස සත්විටක් පෙත්තක් මෙන්.....''
- .''.............කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම්දැයි කියලා.....''
- .''.............උග්ගසේන සිටු පුත්‍රයාණෝ ද කර'ග රහත් වන්නා සේ නොවන මුත් හුවා දඬු අගදී පිළිසිඹියා පත් රහත්ව.....''

නැතහොත්

(i) සාරපලය අඹ දඹ රඹ ද වල්පිට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
රැහැන් සෙමෙන් නොහැරම සිටි පොල් වතු ය
පැසෙයි නිබඳ සුවඳල් කෙත්වත් අවට
දොළින් දොළට කල් යල් කරන නැඹුරුය.

(ii) ගෙයක් කනම සැදූහෙන් දෙවන දකුණුය
සියක් අය කෙරෙහි වැද පුද පැදකුණය
එමැද වෙහෙර දිලි දුරලන සසර බය
දිසෙය වෙහෙර එහි සුරවිමනක් ලෙසට

4. (i) තමන්ට හිමි පොදු දේ නම්
කිසිදු මෙලොක් බව මලෙහි
පිරිසිදු බව පිනි බිඳෙහි
එක්වී මා පුතුගේ ළෙහි අරක් ගනී හැම දිනෙහි
කරදර දහසක් හමු වී ඉන්ටැකි නම් සිනා වෙවී
තමන් ලැබූ දිවි පෙවෙතේ කොටසක් රට සම වෙතේ

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹවේ

ජාතික රණ දෙරණ මතේ
ගැටි ගැටි මළ මොහොතේ

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ

ගල් ලෙන බිඳලා
ලෙන් දොර හැරලා
ගොසින් හැම දෙන
නැතේ කිසිවෙක්

ඇයි සුදු දියණිය
නුඹවත් නොසිටියෙ

පෙරළා එන්නද
ඔහුගෙන් ගැලවී

හෙනයක් සේ පතිත වූ අහසින්
හිස මතට දෙදරුම් දී
බමවා ම ඉදුරන් අඳුරු කරමින්
හරිනා රුදුරු

විසුවාම සමග අලෙයානා
දරුරුවන් දෙදෙනකු දී
දරුරුන් දෙදෙකුම පෙම්බර
ඇයි ද අරුචි වුණේ.

(ii) ගොස් සෙදින මම සොයෙනෙමි වනපෙත
සියලු ම ගම රට හැර කාල හැසිරෙන
නොදනී හසරක් නුපුරුදු ඒ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගත මුදු
ලොව දූක නැත අද වතතුරු නිසි කල

5. අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුල දියේ හළා
අහුන් ලියන් දූන තම ලියට කළ හැක
දුවන මුවන් දූක නොදමන් නෙළු පලා

රන් විමනේ හිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කැමුත් බඩගිනි නැද්ද
මිණි බරනින් සැදූ මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගහටත් හෙණ නොවදිද්ද

වරු බිනෙන තරමට වැරදුණා නොවේ
වරු නැති කෙනෙක් නැති සක්‍රිය මේ ලොවේ

6. **මැටිල්ඩාගේ චරිතය**

- තමා ඉපදී ඇත්තේ සියලුම සැප සම්පත් හා සුඛ විහරන ආස්වාදනය කිරීමටය යන හැඟීම නිසා ඈ නිරන්තරයෙන් දුක් වේදනාවලට භාජනය වූවා ය.
- ස්ත්‍රීන් සම්බන්ධයෙන් කුලය හා පන්තියට වෙනුවට ක්‍රියා කරන්නේ ඔවුන්ගේ රූ සපුව හා භාවනාව ලීලා හා ලලිත කාන්තා ගතිය වන හෙයිනි.
- අද වූ කලී.... සුන්දර රූමත් කාන්තාවන්ගෙන් එකියක් වූවා ය.
- අන්‍යයන් වශී කර ගැනීමටත්....

**ලොයිසල්**

- ඇයි අනේ මම හිතුවා ඔයා ඕකට සතුටු වෙයි කියලා. ඔයා කවදාවත් ගමනක් බිමනක් යන්නේ නැනේ...
- හොඳයි ඔයාට දෙන්නම් ෆ්‍රෑන්කු හාරසියයක්.....
- ටිකක් දෙන්න මැටිල්ඩා එළියට බැස්සොත් හෙම්බිරිස්සාවක් එහෙම......

**ෆොරස්ටියර් මැතිනිය**

- ෆොරස්ටියර් මැතිනිය කණ්නාඩි මේසෙන් විශාල ස්වර්ණාභරන පෙට්ටියක්.....
- ඒකෙන් වැඩක්නෑ අනේ ! අරන් යන්නකෝ ඉතිං
- අනේ මගේ අසරණ මැටිල්ඩා. මගේ ඒ මාලය....

7. දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ
සක් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුනේ

- දෑසේ කඳුලැලි පිසදා බලනෙමි
හෙට හිරු....
- දෙදහස් පන්සිය වසරක් තිස්සේ
(මෙම ප්‍රශ්න සඳහා සුදුසු උදාහරණ ඇත්නම් සුදුසු පරිදි ලකුණු පිරිනමන්න.)

43018

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation
- 2022 (2023 මාර්තු)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.

(ii) මෙම ප්‍රශ්න පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 40 කි.

(iii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල (1) (2) (3) (4) යන උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.

(iv) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසැඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(v) එම උත්තර පත්‍රයෙහි පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. වෛද්‍යවරයෙකු වීම සඳහා ඔහු **එක සිතින්** ඉගෙනීමේ කටයුතුවල නිරත වූවේ ය.
   (1) සතුටු සිතින් (2) දැඩි අධිෂ්ඨානයෙන්
   (3) එක අදහසින් (4) හොඳ සිහියෙන්

2. තමාට කිසි ම **හවිහරණක්** නැති බව සිරිපාල අසල්වැසියන්ට කීවේ ය.
   (1) දියුණුවක් (2) උපස්ථානයක්
   (3) පිහිටක් (4) සුහදකමක්

3. පවතින තත්ත්වය **හමුවේ හරි හතරැස් විදියට** වුවමනාකම් ඉටුකර ගත නොහැකි ය.
   (1) අංගසම්පූර්ණ ව (2) ඉතා පැහැදිලි ව
   (3) නිවැරදි ක්‍රමයට (4) හතරැස් ආකාරයට

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ආයතන ප්‍රධානියා විසින් කාර්යාලයේ ලිපිගොනු ........................ කරන ලදී.
   (1) සමීක්ෂණය (2) සංස්ලේෂණය
   (3) නිරීක්ෂණය (4) අධීක්ෂණය

5. සිද්ධියට අදාළ සැකකරුවන් සෙවීම සඳහා ................................ කණ්ඩායම් දෙකක් යොදවා ඇතැ'යි පොලිස්පතිතුමා පැවසුවේ ය.
   (1) ගවේෂණ (2) සන්දර්ශන
   (3) විමර්ශන (4) නියාමන

6. දක්ෂ සාහිත්‍යකරුවෝ වටිනා අදහස් සමුදායක් එක් ප්‍රබල ........................................ ඉදිරිපත් කරති.
   (1) සංයුතියකින් (2) ආතතියකින්
   (3) සන්තාපයකින් (4) සංකේතයකින්

7. තාලුජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) ඉ, ඊ, ජ, ඤ, ය (2) අ, ආ, ශ, ෂ, ස
   (3) ඍ, ඎ, ර, ෂ, ල (4) එ, ඒ, ත, ද, න

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සූර්‍යතාපය, පරිනාමය, කරුනු, උද්‍ඝාතය
(2) පෞරානික, නිදර්ශන, ලපටි, ව්‍යවස්තාව
(3) කුසලතාව, ප්‍රකාශන, විලාසය, ආකර්ෂණය
(4) ආචාර්ය, වාග්විකරණය, චිරන්ථන, අබිමත

9. අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.
(1) විජේපාල, විජේදාස, විජේවික්‍රම, විජේරත්න
(2) සුගතපාල, සුගතවංශ, සුමනපාල, සුමනදාස
(3) වීරක්කොඩි, වීරකෝන්, වීරබාහු, වීරරත්න
(4) කුලසිරි, කුලරත්න, කුලතුංග, කුලවංශ

10. මුලින් දී ඇති පදයට සමානාර්ථ නො දෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) කුරිරු - දුෂ්ට, නපුරු, නෂ්ට, දරුණු
(2) බිඳුණු - භින්න, බුන්, ඛණ්ඩිත, කඩ
(3) රශ්මි - කිරණ, කර, කැලුම්, රස්
(4) නොයෙක් - අනේක, නානා, විවිධ, නේක

11. මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නිසල - සලිත, සල, චංචල, සසල
(2) කාලය - අවධිය, සමය, කල්, වකවානුව
(3) ආවරණ - සංවෘත, වෘත, නිවෘත, වැසුණු
(4) සජ්ජිත - සැදුණු, සුසැදි, පිහිටි, යුක්ත

12. එක් එක් වචනයෙහි දෙවන අකුරෙහි කෙටි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ගැට ඇලපිල්ල, කෙටි ඇද පිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) මිහිරි, නුහුරු, අතුරු, ඔරුව
(2) අසිරු, උපුල්, විභූත, සභාව
(3) තුහිනය, විරූප, නිකෘෂ්ට, පැහැදිලි
(4) වරාය, අරුම, ප්‍රව්‍රජිත, දයාව

13 නීති + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එකතු වූ විට සෑදෙන නිවැරදි වචනය තෝරන්න.
(1) නෛත්තික (2) නීතික
(3) නේතික (4) නෛතික

14. ප්‍රථම පුරුෂ උක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මුවන්, සිංහයෙකු, ඔහු, උන් (2) ගුරුවරු, කවියෙක්, ඔවුහු, ඕ
(3) නුඹ, අපි, ඇතමුන්, ඇය (4) මම, තොපි, හේ, ඔවුන්

15. පූර්ව ක්‍රියාවක් ඇතුළත් පිළිතුර තොරන්න.
(1) හිරු නැගෙන පියුම් විකසිත වෙයි.
(2) මුව රංචුව වට පිට බල බලා දිව්වෝ ය.
(3) ශිෂ්‍යයෝ පන්තියට පැමිණ ඉගෙනීමේ කටයුතු ආරම්භ කළෝ ය.
(4) පෙරහැර එද්දී අපි ඒ දෙසට ගියෙමු.

16. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) තද්ධිත - දෛශික, කනිෂ්ඨ, ඥානවන්ත, දුර්වලතා
(2) කෘදන්ත - ගැයුවේ, වැටුණු, බලන, නැටුම්
(3) උපසර්ග - සම්පාදනය, කාරුණික, නිර්මිත, සුචරිත
(4) නිත්‍ය බහු වචන - සමහරෙක්, අයෙක්, ඇතමුන්. යමෙක්

17. එකම - වර්ගයට අයත් නො වන යුගල පද ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) ඇනමැන, වතුපිටි, කාබි, ලට්ටලොට්ට
(2) අබලදුබල, ලේසි පහසු, ලිපිලේඛන, වසවිස
(3) සද්දබද්ද, උදවුපදවු, නෑගිබෝග, අඩුමකුඩුම
(4) අගමුල, එදාමෙදා, අඩුවැඩි, සිරිත්විරිත්

- පරිත්‍යාගශීලීන් ලබා දුන් මුදල්වලින් තරුණ සංගමයේ සාමාජිකයෝ නගරයේ සිටින අසරණයන්ට වියළි ආහාර බෙදා දුන් හ.

18. ඉහතින් දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් විභක්ති අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) අවධි, සම්බන්ධ, ආධාර
(2) කරණ, ප්‍රථමා, සම්ප්‍රදාන
(3) ආධාර, ප්‍රථමා, සම්බන්ධ
(4) කර්ම, කර්තෘ, අවධි

19. නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් නො යෙදුණු වාක්‍යය තෝරන්න.

(1) දුෂ්කර පාසල්වල ළමයි අඩුපාඩු මධ්‍යයේ දැඩි උත්සාහයෙන් ඉගෙන ගනිති.
(2) ලස්සන කුරුල්ලෝ තුරු මුදුන්වල සිට සතුටින් කෑ ගසති.
(3) හංසයන් විලෙහි පීනද්දී කොක්කු බලා සිටියෝ ය.
(4) සුන්දර දිය ඇල්ල ළමයි ආසාවෙන් නැරඹුවෝ ය.

20. A - පූර්ව ස්වර ලෝප සන්ධිය - ප්‍රථමාධාර , පරමායුෂ
B - ආගම සන්ධිය - නතරුත්, සිතුවම්
C - ස්වරාදේශ සන්ධිය - විශේෂාංග, පූජෝපහාර
D - පූර්ව රූප සන්ධිය - පිළියම්, දඬුවම්

ඉහත දක්වා ඇති සන්ධි පිළිබඳ ව නිවැරදි ගැළපීම වන්නේ,

(1) A හා C ය. (2) B හා D ය.
(3) B හා C ය. (4) A හා D ය.

21 එක් එක් පේළියේ පදවල අර්ථ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) තුදුස් පද - පද දොළහ, ඇවෑමෙන් - අන්තිමට
(2) දෘශ්‍ය කාව්‍ය - නවකතා, පෙරපර - අපරදිග
(3) සියත් බව - ස්වීයත්වය, සඳ වෙල - සන්ධ්‍යා වලාකුළ
(4) පරිණත - නොමේරූ, සුපේශල - පැහැදිලි

22. A - කෘෂි කර්මාන්තය .............................. අතීතයේ සිට මෙරට වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය යි.
B - චිරාගත සම්ප්‍රදායානුකූලව වර්ෂයක් ..............................දළදා මාලිගාවේ පෙරහැර පැවැත් වේ.
C - දේශනය ආරම්භ වූ ..............................සියල්ලෝ ම නිශ්ශබ්ද වූහ.
D - ආයතන ප්‍රධානියා දුන් උපදෙස් ......................... කාර්යාල සහායකයා වගකීම් ඉටු කළේ ය.

A, B, C, D, යටතේ දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු නිපාත අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කැටුව, අනුව, සඳහා, උදෙසා
(2) වනාහි, පාසා, හෙයින්, අනුව
(3) උදෙසා, හෙයින්, සමඟ, අනුව
(4) අනුව, උදෙසා, වනාහි, පාසා

23. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) අනුස්වාරය, හා විසර්ගය ස්වරාරූඪව නො යෙදේ.
(2) ශුද්ධ ව්‍යඤ්ජන ශබ්ද සඳහා 'හල්' ලකුණ යෙදේ.
(3) ව්‍යඤ්ජනයට පසුව යෙදෙන ''ය'' වෙනුවට රකාරාංශය යෙදිය හැකි ය.
(4) අ, ආ, කණ්ඨජ අක්ෂර ප්‍රභේදයට අයත් වේ.

24. මුනිපුද, දිනපති, යන පද අයත් සමාස වර්ගය අනුපිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

(1) විභක්ති සමාසය, අන්‍යාර්ථ සමාසය

(2) අව්‍යය සමාසය, විශේෂණ සමාසය

(3) අන්‍යාර්ථ සමාසය, විශේෂණ සමාසය

(4) ද්වන්ද්වාර්ථ සමාසය, අව්‍යය සමාසය

- අංක 25 සිට 27 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.

25. උසස් කාව්‍ය නිර්මාණයක් පබැඳීම සඳහා කවීන්ට කාව්‍යාලංකාර භාවිතය පිළිබඳ මනා පරිචයක් තිබිය යුතු ය.

(1) උත්සාහයක් (2) අභියෝගයක්

(3) පළපුරුද්දක් (4) විවේකයක්

26. මෙරට සමාජ ප්‍රගමනය සඳහා සියලු වැසියන්ගේ සමගිය අත්‍යවශ්‍ය බව නායක හිමිවරු පැවසූහ.

(1) පරිහානිය (2) දියුණුව

(3) සංතුලනය (4) සංග්‍රාමය

27. අපේ ජාතික ගීය, මාතෘභූමිය කෙරේ ගෞරවනීය හැඟීම් උද්දීපනය කරන පද මාලාවකින් සමන්විත වේ.

(1) පහළ කරන (2) පැහැදිලි කරන

(3) ප්‍රබෝධ කරන (4) ප්‍රසන්න කරන

28. රූපකයක් නො යෙදුණු පිළිතුර තෝරන්න.

(1) කරුණා මෙත් සිසිල් දියේ

(2) සුරත් තඹුරු පෙති සෙ නෙතින්

(3) නිල් ගුවනේ තාරකා මල් හිනැහිලා

(4) ජීවිතයේ කාන්තාරයේ තුරුණු වියළි වැල්ලේ

29. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධයක් නො දක්වෙන පිළිතුර තෝරන්න.

(1) අඬුව, කියත, නියන, මිටිය (2) නිවිති, සාරණ, තම්පලා, කංකුන්

(3) මේසය, පුටුව, ඇඳ, බංකුව (4) පිඟාන, රබාන, වට්ටිය, පහන

- අංක 30, 31, යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

30. (1) දරුවෝ වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපැදිය යුතු ය.

(2) දේශකයන් දෙදෙනෙක් සාකච්ඡාවට සහභාගි වෙති.

(3) නීතිඥයෝ අධිකරණ ශාලාවට පැමිණියේ නැත.

(4) ඔහු වීරයෙකු මෙන් ක්‍රියා කළේ ය.

31. (1) අපි මිතුරන් සමග නාට්‍යය නැරඹීමට ගියෙමු.

(2) අසල්වැසියෝ උදව් කරති'යි ඔවුහු සිතුවෝ ය.

(3) කම්කරුවන් විසින් වැඩ කරන ලදහ.

(4) තුඹ නොහොත් මම රැස්වීමට යන්නෙහි.

32. පහත සඳහන් ගීත බණ්ඩයේ අවසන් කොටස නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

දන පිනන සතර සඟරාවතින්
සත සිත ගත සැනහේවා
සඟ වෙද ගුරු ගොවි කම්කරු බල ඇණියෙන්
..........................................................................

(1) ජනතා දිනේ දිනේ
(2) යළි හෙළ බිම ඉපදේවා
(3) රන් දිව හිනැහේවා
(4) සිවු දිග සැරසේවා

33. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"එයාලා හැමදාම නිකං ටවුමට යනවා"

(1) ඔවුන් හැමදාම නිකරුණේ නගරයට යති.
(2) ඔවුහු දිනපතා නිකරුණේ නගරයට යති.
(3) ඔවුන් දිනපතා අනිවාර්යෙන් ම නගරයට යති.
(4) ඔවුහු සෑම දින ම විවේකයට නගරයට යති.

- අංක 34, 35, යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

34. වැරදි ක්‍රියාවක් කළ තැනැත්තා ඒ පිළිබඳ ව නිතර පසුතැවීම

(1) කපන්න බැරි අත සිඹින්නා වගේ
(2) අනුන්ට කැපූ වළෙහි තමන් ම වැටුණා වගේ
(3) අබ කෑ මිනිහගේ නාහෙ දනවා වගේ
(4) ගිරයට අසු වූ පුවක් ගෙඩිය වගේ

35. ඉතා සුළු කාරණයකින් පවා කෝපයට පත්වීම

(1) හොස්ස අගින් මැස්සා යන්න බෑ වගේ
(2) කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ
(3) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ
(4) ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගේ

36. සැහැලි කාව්‍ය වර්ගයට අයත් පද්‍ය නිර්මාණය ඇතුළත් වරණය තෝරන්න.

(1) සිනා කුමාරි
(2) කුකුළු හැවිල්ල
(3) ගම අමතකයි
(4) හඳ සහ නිව්යෝර්ක් නුවර

37. "සිය දුකට වඩා මෙරමා දුක් ඉවසිය නොහෙන" ඒ මහසත් තෙම........... යන පාඨයෙහි "මෙරමා" යන්නෙහි අර්ථය වන්නේ,

(1) තමන්ගේ
(2) ඔහුගේ
(3) අන්‍යයන්ගේ
(4) මිත්‍රයන්ගේ

- පහත දැක්වෙන පාඨයෙහි සමීප අර්ථය අන්තර්ගත වාක්‍යය තෝරන්න.

38. විදේශවලින් ණය ලබා ගන්නා විට එම ණයත් ණයට පොලියත් ගෙවන්නට සිදුවීම කරණ කොට ගෙන අනාගත රටවැසියන් කරදරයට වැටීම වළක්වාලිය යුතු ය.

(1) විදේශ ණය මුදල් ලබාගැනීම මගින් හෝ රට සංවර්ධනය කළ යුතු ය.
(2) විදේශවලට ණය වීම හේතුවෙන් අනාගත පරපුරට ප්‍රශ්න ඇති කළ යුතු නොවේ.
(3) අනාගත රටවැසියන්ගේ අභිවෘද්ධියට පිටරටවලට ණය වීමේ වරදක් නැත.
(4) ලබා ගන්නා ණය සඳහා පොලිය ගෙවීම අනාගත පරපුරට භාර දීම සුදුසු නැත.

39. "සමහරු ශ්‍රේෂ්ඨව උපදිති. සමහරු ශ්‍රේෂ්ඨත්වය උදාකර ගනිති. මෙම විවරණය කළ නාට්‍ය රචකයා වන්නේ,

(1) විලියම් ශේක්ෂ්පියර්  (2) ජයලත් මනෝරත්න
(3) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර  (4) හෙන්රි ජයසේන

40. උඩරට භාෂාවේ "පුන්නනවා" යන යෙදුමේ පොදු ව්‍යවහාරය කුමක් ද?

(1) නිදියනවා  (2) විවේක ගන්නවා
(3) නළවනවා  (4) පීනනවා

(ල . 1 x 40 =40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

48014

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / நேரம் / Time: පැය 02 |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත දී ඇති පදවල ව්‍යඤ්ජන හා ස්වර වෙන් කර ලියන්න.
(අ) යතුර (ආ) සෘජු

(ii) පහත සඳහන් පද නිවැරදි ව විසන්ධි කර ලියන්න.
(අ) බුත්සරණ (ආ) පුනරුත්පත්තිය

(iii) පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් නිවැරදි ව ලියන්න.
(අ) නිදාන (ආ) නිධාන

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
කැළණි විහාරය වන්දනා කිරීමට ගිය සැදූහැවත්තු එහි ඇති ලේඛණාගාරය ද නැරඹූහ.

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) සියලු රටවැසියෝ බුද්ධිමත් වීම මැනවි.
(ආ) සාකච්ඡා මණ්ඩපයේ කාන්තාවන් ද ඇත.

(vi) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) විධිමත් (ආ) තරග

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇති සමාස පද දෙකක් ලියන්න.
වැසිජලය ප්‍රයෝජනයට ගෙන කරන ගොවිතැන් සඳහා අප අනුබල දිය යුතුයි.

(viii) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.
(අ) මා විසින් පොතපත පරිශීලනය කරනු ලබයි.
(ආ) කම්ටු නියෝජිතයන් විසින් සාමාජිකයෝ අගය කරන ලදහ.

(ix) විදුහල්පතිතුමා පැමිණෙත් ම සිසුහු අසුන්වලින් නැගිට ආචාර කළහ. මෙම වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද ප්‍රවර්ගය ලියන්න.

(x) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) කටට ආ දෙය කියන්නා

(ආ) බොහෝ දුර නොදකින (ලකුණු 02 x 10 - 20 යි)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අපේ සාම්ප්‍රදායික ආහාර භෝග ලෙස හැඳින්වුණු කොස්, දෙල්, අල, බතල, මුං, කුරක්කන් වැනි ශක්තිජනක දේශීය ආහාර මගින් ආර්ථිකයට ලැබුණු දායකත්වය අපට අමතක නො වේ. නමුත් ඒවා පසෙක ලා ඇස, දිව පිනවන කෘත්‍රිම, පහසු ආහාර රටාවකට නැඹුරු වීමෙන් මේ වන විට විනාශකාරී මගකට ඇද වැටී ඇති බව නොරහසකි. මේ තත්ත්වයන් සියල්ල සලකා බලා දේශීය භෝග වගාව සඳහා ජනතාව උනන්දු කරලීමේ කඩිනම් වැඩසටහනක් කෙරෙහි සැමගේ අවධානය යොමු විය යුතුයි.

(ආ) ලෝක යුද්ධ පිළිබඳ ව අසා ඇති තොරතුරුත් ඒවා පිළිබඳ ඉතිරි වී ඇති අමිහිරි මතක සටහනුත් අප මහත් ප්‍රකම්පනයට පත් කරයි. ඒවායින් ජයග්‍රහණය ලබන්නේ කුමන පාර්ශ්වයක් වුවත් මනුෂ්‍ය සංහතියට ම එහි සෘජු හා වක්‍ර බලපෑම් මගින් සිදු කරන විනාශය මුදලින් මිනිය නො හැකි ය. මේ පිළිබඳ ව සිතා බලා සාමය පැතිරවීම කෙරෙහි ලෝක බලවතුන් සැලසුම් සකස් කළ යුතුයි.

(ඉ) අන්තර්ජාලය මගින් සිසුන්ට සිදුවන අනතුරු වැළැක්වීමේ පියවරක් ලෙස එය භාවිතය තහනම් කිරීම විසඳුමක් නො වේ. ගෝලීයකරණය සහ නව තාක්ෂණයෙහි දියුණුව සමග රටක් වශයෙන් ඉදිරියට ගමන් කිරීමට මෙම නව ප්‍රවණතා ඉවහල් වන අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ද මහඟු පිටිවහලක් වේ. එබැවින් අන්තර්ජාලය සුරක්ෂිත ව භාවිතය සඳහා ළමා පරපුර මෙන් ම ගුරු භවතුන්, විදුහල්පතිවරුන්, අධ්‍යාපන නිලධාරීන් සේ ම යම් ගැටලු සහගත තත්ත්වයක් ඇති වුවහොත් අනුගමනය කළ යුතු නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ ව වැඩිහිටියන් ද දැනසිටීම වැදගත් වේ.

(ඊ) දකුණු ආසියානු කලාපය මාර්ග අනතුරු බහුල කලාපයක් ලෙස ප්‍රකට ය. එයිනුත් ශ්‍රී ලංකාව මාර්ග අනතුරු බහුල රටක් ලෙස වාර්තා වේ. අනතුරු බහුල වීමෙන් අප රටට දිනපතා අහිමිවන මානව සම්පත් ද භෞතික සම්පත් ද අපමණ ය. මේ තත්ත්වය ඇතිවීමට තුඩු දුන් හේතු පරීක්ෂා කොට එකී ආපදා අවම කර ගැනීමේ ප්‍රායෝගික විසඳුම් පිළිබඳව සොයා බැලිය යුතුයි.

(ලකුණු 25 යි.)

පහත දැක්වෙන පාඨය වචන 65-75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

යම්කිසි සාහිත්‍යාංගයක් ලෝකයේ හැඩරුව වෙනස් කිරීමට දායක වී ඇත්නම් ඒ සාහිත්‍යාංගය අන් කිසිවක් නොව විද්‍යා ප්‍රබන්ධයයි. අනාගතය දෙසට බැල්ම හෙළමින් අනාගතයට අප පෙර සූදානම් කරන විද්‍යා ප්‍රබන්ධය අද වන විට දියුණු රටවල ප්‍රමුඛ සාහිත්‍ය ධාරාවක් බවට පත්වෙමින් තිබේ. ලොව වැඩි ම ආදායමක් හා ජනප්‍රියත්වයක් ලැබූ සිනමාපට, රූපවාහිනී කතාමාලා හා කෘතීන් පිළිබඳ විමසා බැලුව හොත් ඒවායේ කැපී පෙනෙන ඉඩක් අත්පත් කර ගැනීමට විද්‍යා ප්‍රබන්ධයට හැකි වී ඇති ආකාරය දැකිය හැකියි. ලෝකයේ විද්‍යා ප්‍රබන්ධ උමතුව. එවැනි තත්ත්වයක පැවැතිය ද ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රබන්ධවලට හිමි ව ඇත්තේ අඩු සැලකිල්ලකි. එය අපගේ රසවින්දන මට්ටම පිළිබඳව ද ප්‍රශ්නාර්ථයක් ඉතිරි කරයි. සිනමා, ටෙලිනාට්‍ය යන ක්ෂෙත්‍ර ගත්ත ද, වැඩිපුර ම අපට අසන්නට දකින්නට ලැබෙන්නේ එදිනෙදා ජීවන අර්බුද පිළිබඳ කතා, රජකතා, ඉතිහාස කතා, පැරණි වලව් ඇසුරු කර ගත් කතා වැනි සීමාසහිත රාමුවකට කොටු වූ නිර්මාණයි. පාඨක ප්‍රේක්ෂක මනස සාම්ප්‍රදායික රාමුවලින් බිඳ දමා නව්‍ය චින්තනයකට ඔසවා තැබිය හැකි නිර්මාණ මේ අතර අපට දැකිය හැකි ව ඇත්තේ අතලොස්සක් පමණි. ඒ අතරින් ද ගුණාත්මකභාවය පිළිබඳ ව සෑහීමකට පත්විය හැකි නිර්මාණ ඇත්තේ ද සුළු ප්‍රමාණයකි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රබන්ධ ක්ෂෙත්‍රයේ ඇති මේ පසුගාමී ස්වභාවය වෙනස් කර එහි නව නැම්මක් අතිකර ගැනීමට අවධානය යොමු වී තිබේ. නමුත් මෙවැනි නිර්මාණ සඳහා අතිවිශාල පිරිවැයක් දරන්නට සිදුවීමත් තාක්ෂණික මෙවලම් සඳහා ඇති ගැටලුවත් නිසා යම් කැපවීමක් කළ යුතු බව සැබවි. අනෙක් අතට වාණිජ වශයෙන් සාර්ථක නිර්මාණයක් බිහි කිරීම කෙරෙහිත් ඔවුන්ගේ අවධානය යොමු වී තිබේ. ප්‍රේක්ෂක, පාඨක රසවින්දනය පුළුල් පරාසයක පැතිරෙන මෙවන් යුගයක තම නිර්මාණය තුළ ඔවුන් රඳවා ගැනීමට විවිධ උපක්‍රම භාවිත කිරීමටත් මේ නිර්මාණ සමත් විය යුතුයි.

(ලකුණු 10)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඉල්මනයිට් යනු සුවිශේෂ ඛනිජ විශේෂයකි. සඳ වෙත ගිය ඇපලෝ - 11 (Apolo - 11) සඳගාමීන් විසින් රැගෙන එන ලද පාෂාණ අතරින් ද සොයා ගැනීමට හැකි වූ මේ ඛනිජ විශේෂය පෘථිවිය මත වසර බිලියන තුනකටත් වඩා ඈත අතීතයේ දී බිහිවන්නට ඇති බව විශ්වාස කෙරේ. මේවා ඉතා තද පාෂණ වන අතර වසර දහස් ගණනක් භූගත ජලධාරා ඔස්සේ ගසා ගෙන ගොස් නිධි ලෙස තැන්පත් වී ඇත. මේ නිධි තුළ ඉල්මනයිට්වලට අමතර ව රූටයිල් සහ සර්කෝන් යන ඛනිජ වර්ග ද පවතියි. ඉල්මනයිට්හි වටිනාකම ඉහළ යාමට බලපාන ප්‍රධාන හේතු සාධකය වන්නේ මේ ඛනිජ නිස්සාරණයෙන් ලබා ගන්නා ටයිටේනියම් ලෝහය සතු සවි ශක්තියයි. ටයිටේනියම් සුළු ප්‍රමාණයක් වුව ද වෙනත් ලෝහ සමග එක් කිරීමෙන් සාදා ගන්නා මිශ්‍ර ලෝහ ශක්තිමත් බවින් අගතැන්පත්වන අතර මේවා ක්‍රීඩා උපකරණ සාදා ගැනීමට සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ දී ගෙවී ගිය මිනිස් අස්ථි කොටස් වෙනුවට කෘත්‍රිම සන්ධි සැකසීම සඳහා ද බෙහෙවින් යොදා ගනී. ශ්‍රී ලංකාවේ පුල්මුඩේ පිහිටි ඉල්මනයිට් සංචිතය අප රටට සොබාදහමෙන් ලැබුණු මහඟු දායාදයකි. එම නිධියෙන් 70% ක් පමණ පිරිසිදු ඉල්මනයිට් වන අතර එමගින් සුපිරිසිදු ටයිටේනියම් ලෝහය ටොන් ගණනක් නිස්සාරණය කිරීමට හැකියාව ඇත. එහෙත් ඉල්මනයිට් රූටයිල් හා සර්කෝන් වැනි පාෂාණ එලෙස ම භාරා රට පැටවීම අනාගත අභිවෘද්ධිය උදෙසා සුදුසු පියවරක් නොවේ. තව ද මුහුදු මට්ටම ඉහළ යාම පිළිබඳ අවදානමක් පැවැතීම නිසා අපට බොහෝ කාලයක් මේ නිධි එපරිද්දෙන් ම රැක ගැනීමට නො හැකි වනු ඇත. ඒ නිසා ඉල්මනයිට් මගින් ටයිටේනියම් ලබා ගත හැකි නවීන තාක්ෂණික මෙවලම් නො පමා ව අප සතු විය යුතුයි.

(i) ඉල්මනයිට් ඛනිජය බිහි වී ඇති කාල වකවානුව කුමක් ද?

(ii) ඉල්මනයිට් නිස්සාරණය තුළින් ලබාගන්නා ප්‍රධාන ශක්තිමත් ලෝහය කුමක් ද?

(iii) මිශ්‍ර ලෝහ යොදා ගෙන සිදු කරන කාර්යයන් දෙකක් ලියන්න.

(iv) ශ්‍රී ලංකාවේ ඉල්මනයිට් ලෝහය පිහිටා ඇති ස්ථානය කුමක් ද?

(v) අප රටේ අනාගත සංවර්ධනය සඳහා බාධාවක් වන කාරණය ලෙස ඡේදයේ දක්වා ඇත්තේ කුමක් ද?

(ලකුණු 10යි)

5. ප්‍රදේශයේ ආර්ථික අපහසුතා ඇති සාමාජිකයන් සඳහා සේවාවන් සැපයීමේ අරමුණින් ආහාර භෝග නොමිලයේ ලබා දීමේ සති අන්ත පොළක් සංවිධානය කිරීමට සඳහැන්න ග්‍රාම සංවර්ධන සමිතියේ මාසික රැස්වීමේ දී තීරණය විය.මේ සද්කාර්යය සඳහා ප්‍රදේශයේ ම දානපතියන්ගේ අනුග්‍රහය ලැබේ. මෙම වැඩසටහන පැවැත්වෙන නිශ්චිත දිනයන්, වේලාවන්, එයින් ලැබෙන ආර්ථික වාසි, මෙය පැවැත්වෙන්නේ කවුරුන් සඳහා ද? එය ක්‍රියාත්මක වන ආකාරය ආදී කරුණු පිළිබඳ ව ප්‍රදේශවාසීන් දැනුම්වත් කිරීමේ අත්පත්‍රිකාවක් සකසන්න. ඔබ එම සමිතියේ ලේකම් සාගර කුලතුංග යැයි සිතන්න. (වචන 100- 125 පමණ ප්‍රමාණවත් ය.)

නැතහොත්

දඹසිත්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද 'දිරිය දියණි' උපහාර උලෙළට සහභාගි වූ පුවත්පත් වාර්තාකරුවෙකුගේ සටහනක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| මාතෘකාව | : | ආබාධිත දූරියක වූ සරලා අධිකාරී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විශිෂ්ට සම්මාන සහිතව සමත් වීම, |
| දිනය | : | 2022.10.30 |
| වේලාව | : | පෙ.ව. 10.30 |
| ස්ථානය | : | ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරය |
| ප්‍රධාන ආරාධිතයා | : | මහාචාර්ය රන්සිත් කරුණාජීව |
| විශේෂ දේශනය | : | දඹසිත්යාය විද්‍යාලයේ විදුහල්පති රෝහණ දිසානායක |

ප්‍රදේශයේ දානපතියන් විසින් ඇය වෙනුවෙන් තිළිණ ප්‍රදානයක් ද තවත් සංවිධාන රැසකින් ඇයගේ උසස් අධ්‍යාපනය සඳහා මුදලින් ත්‍යාග ද පිරිනැමීම විශේෂත්වයකි.

ඉහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පතක පළ කිරීම සඳහා යෝග්‍ය වාර්තාවක් සකස් කරන්න. පුවත්පත් වාර්තාකරු ඔබ යැයි සිතන්න. (මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි.)